

**‘මා නිවත්ත අභික්කම’ - නො නැවත ඉදිරියට යවු**



| | | |
|---|---|---|
| **55 වන කාණ්ඩය** | **බු.ව. 2556 බක් මස පුරපසළොස්වක දා ක්‍රි.ව. 2013 අප්‍රේල් මස 25 වන දා** | **12 වන කලබ** |





# හැමද අවුරුදු

ලක් දරුවෙනි නුඹලාගේ සිත්වල
ගුණ මල් විකසිත වන විට නිරතුරු
රටට දැයට කිරි උතුරනවා
හැමද අවුරුදු මිහිර දැනෙනවා

සිංහල අවුරුදු නම් එක දවසයි !
සිංහල කම හැම දට හොඳයි
ගුණ නුවණින් ඔබ පෙරට නැගෙන කල
අවුරුදු මල් හැමද හිනැහෙයි

**- අනඳ**



# බුදු පියාණන් වහන්සේ ස්ත්‍රීන් හට දැක්වූ මහාකරුණා මහිමය

**අතිගරු අම්පිටියේ ශ්‍රී රාහුල නායක මාහිමිපාණන් වහන්සේ විසිනි**

අප භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වන්නට පෙර සිට දඹදිව ස්ත්‍රීහු ඉතා දුකින් කල් යැවූහ. ඔවුනට කිසි ම නිදහසක් නො තිබිණ. එකල ළදරු විවාහ ගිවිසුම් පැවතිණ. ඉදින් ගිවිස ගත් සැමියා මළහොත් ළදැරිය ඔහුට අනුව දිවි නසා ගත යුතු ය. කනවැන්දුම්යනට කිසි ම මංගල ක්‍රියාවකට සම්බන්ධ වන්නට ඉඩක් නො ලැබිණ. ඔවුන් තමන් ගේ පව් සෝද හැරීමට දිවි හිමි කොට ම යාග කරන බමුණනට මෙහෙ කටයුතු යයි එකල පැවැති නියමයකි. එහෙයින් තිරිසනුන් මෙන්, දසියන් මෙන් ඔවුහු බොහෝ දුක් ගැහැට වින්දාහ. ස්ත්‍රිය ඉතා මෝඩ වූ, අපිරිසිදු වූ කෙලෙස් ගොඩකැ යි ද සලකන ලදි.

මෙසේ දිගු කලක් උසස් ශාස්ත්‍රග්‍රහණයක් හෝ ධර්මශ්‍රවණයක් හෝ නැතිව ලෝකය දෙස නිදහස් ලෙස බලන්නටවත්, සිතන්නටවත් ඉඩක් නොලැබීම හේතු කොට ගෙන ස්ත්‍රී පක්‍ෂය සැබැවින් ම පහත් බවට පැමිණියේ ය. හීන දීන භාවයෙහි ඇද වැටුණේ ය.

මෙවැනි කලෙක සව් සත්නට සෙත් පිණිස ලොව පහළ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ස්ත්‍රී පක්‍ෂයට දැක්වූ මහා කරුණා මහිමය ඉතා ම ආශ්චර්‍ය්‍ය ය. අන් කිසිම ශාස්තෘවරයකු විසින් පෙර නොකරන ලද විරූ විශේෂානුකම්පාව නම් මේ

උතුම් බුද්ධශාසනය පිරිමින් හටත් ස්ත්‍රීන් හටත් සමසේ උරුම කිරීම ය. ඒ මහාකාරුණිකයන් වහන්සේ මහණ සස්නක් මෙන් ම මෙහෙණි සස්නක් ද ඇති කළ සේක. ලෝකයේ පළමුවරට ස්ත්‍රී පක්‍ෂයට සභාවක් පිහිටුවා වදාළේ බුදුරජාණන් වහන්සේ ය. එය වනාහි භික්‍ෂුණී සංඝ සභාවයි. ඒ ඒ කාරණයෙන් අගතැන් පැමිණි මහා ස්ථවිරයනට ඒ ඒ අගසව් තනතුරු දී වදාළාක් මෙන් ම එසේ වූ මහා ස්ථවිරාවනට ද ඒ ඒ අග්‍රශ්‍රාවිකා තනතුරු දී වදාළ සේක. ඥානයෙන්, ඍද්ධියෙන්, චිත්‍රකථිකත්වයෙන්, විනයධරත්වයෙන් අගතැන් පැමිණි සුප්‍රසිද්ධ වූ භික්‍ෂූන් වහන්සේලා මෙන් ම මෙහෙණින් වහන්සේලා ද මේ සස්නෙහි වූහ. අනාථපිණ්ඩික ආදි උපාසකයන් මෙන් ම විසාඛාදි උපාසිකාවෝ ද එසේ තනතුරු ලැබූහ. භික්‍ෂූන් හා උපාසකයන් මෙන් ම භික්‍ෂුණීන් හා උපාසිකාවෝ ද බුදුරජාණන් වහන්සේ ගෙන් ප්‍රශ්න විචාරන්නට, දහැමි කථා අසන්නට අවකාශ ලැබූහ.

'ඉත්ථී භණ්ඩානමුත්තමං' යනුවෙන් මේ ලෝකයෙහි ඇතිතාක් බඩු අතුරෙන් ස්ත්‍රිය ඉතා ම උසස් භාණ්ඩය බවත් 'භරියාව පරමො සඛා ' යනුවෙන් ස්වාමිපුරුෂයාගේ හොඳ ම මිත්‍රයා නම් භාර්‍යාව බවත් පවසමින් ඇයට සංග්‍රහ කටයුතු පිළිවෙළ ද ලෝකයා හට උගන්වා වදාළ සේක. භාර්‍යාව මෙන් ම ස්වාමිපුරුෂයා විසින් භාර්‍යාවට ද ගරු බුහුමන් කොට කථා කිරීමෙන් ද, පරොස් බස් ආදියෙන් අවමන් නො කිරීමෙන් ද, සිහිනෙනුදු ඇය නො ඉක්මවා හැසිරීමෙන් ද, (පිරිසුදු චරිතයෙන් ද) පොහොසත් තරමින් ඇඳුම් පැළඳුම් ආදිය සලසා දීමෙන් ද, මඳකුදු අවිශ්වාස නො කොට අවංක විශ්වාසයෙන් ප්‍රේමයෙන් හැම දේපළ නො සඟවා යතුරු මුදුත් සමඟ භාර කොට දීමෙන් දැයි යන ආදියෙන් සංග්‍රහ කටයුතු බව අප මහාකාරුණික බුදුපියාණන් වහන්සේ වදාළ සේක.

සප්ත භාර්‍යා, සුමනා, මල්ලිකෝවාද ආදි සියගණන් සූත්‍රයන්හි යහපත් අයහපත් භාර්යාවන් ගැන ද ස්ත්‍රීන් අභිරූප

වන පරිදි ආදිය ගැන ද, සුගතිගාමී ව භව සම්පත් ලබන පරිදි ගැන ද, ස්ත්‍රීන්ගේ දෙලොව දියුණුව ගැන ද වදාළ කරුණු අප්‍රමාණ ය. ඒ ධර්මස්කන්ධ ගැන බලන කල අප බුදුපියාණන් වහන්සේ ස්ත්‍රී පක්ෂයට කොතරම් හිතානුකම්පාවක් දැක්වූ සේක් දැයි වටහා ගත හැකි ය. ඇතැම් අන්‍ය ශාස්තෘන්ගේ ආගම්වල මෙතරම් බණ කඳු රැසක් තබා විශේෂයෙන් ස්ත්‍රීන් පිළිබඳ ව කී පේළි හත අටක් වත් දැක ගැනීම උගහට ය.

දිනක් කොසොල් මහ රජතුමා බුදුරජාණන් වහන්සේ වෙත ගොස් වැඳ එකත් පසෙක හුන්නේ ය. එවිට එක්තරා පුරුෂයෙක් රජු කරා එළඹ ඔහුගේ කනට කොඳුරා "දේවයන් වහන්ස, මල්ලිකා දේවිය දුවක වැදූහ"යි සැළ කළේ ය. මෙය අසා රජ නොසතුටු විය. ඒ බව දත් බුදුරජාණන් වහන්සේ ,

**ඉත්ථී'පි හි එකච්චියා - සෙය්‍යා පොස ජනාධිප**
**මෙධාවිනී සීලවතී - සස්සුදෙවා පතිබ්බතා**

යනුයෙන් "මහරජාණෙනි, නුවණ ඇත්තා වූ, ශීලයෙන් ආචාරයෙන් යුක්ත වූ නැදිමයිලන් දෙවියන් කොට සලකන්නා වූ, පතිව්‍රතා ධර්මයෙන් යුක්ත වූ ඇතැම් ස්ත්‍රීහු සමහර පිරිමින්ටත් වඩා උතුම් වෙති. එබැවින් මහරජ, නො කළකිරී ඒ ළදැරිය (කුමරිය) ආදරයෙන් පෝෂණය කළ මැනැවැ"යි වදාළ සේක. එවැනි සිල්වත්, නැණවත් මවුවරු ම රාජ්‍ය පාලනයෙහි පවා දක්ෂ තේජෝබල පරාක්‍රම ඇති ශූර වීර දරුවන් ඇති කරති. දෙවිවරු පවා සිල්වත්, ගුණවත් ස්ත්‍රීන් දක්නට පැමිණෙති.

සැදැහැවත් බෞද්ධ මෑණිවරුන් විසින් සිය දූවරුන් නකුල මාතාව මෙන් ද, ඛුජ්ජුත්තරාව මෙන් ද, හදාවඩා ගත යුතු බවත්, මහණ වූ දූවරුනට ඛෙමා - උප්පලවණ්ණා රහත් මෙහෙණින් වහන්සේලා මෙන් සිල්වත් ව, ගුණවත් ව ඉතා ම හොඳින් මහණදම් පුරන්නට අවවාද කළ යුතු බවත් සිය පුතුන් චිත්‍ර සිටාණන් මෙන් ද, අලව්කුමරා මෙන් ද හදාවඩා

ගතයුතු බවත්, මහණ වූ පුතුන්ට සැරියුත් මුගලන් මහ රහතන් වහන්සේලා මෙන් සිල්වත් ව, ගුණවත් ව ඉතා ම හොඳින් මහණ දම් පුරන්නට අවවාද කළ යුතු බවත් අපේ තිලෝගුරු බුදු පියාණන් වහන්සේ ස්ත්‍රීන් හට වදාළ සේක.

'මාතා මිත්තං සකේ ඝරේ' යනුයෙන් සිය ගෙදර සිටින හොඳම මිත්‍රයා නම් මෑණියන් වහන්සේ යයි වදාළ සේක. තම දූ දරුවන් හොඳින් තැනීම මවුවරුන් ගේ ලොකුම යුතුකම වේ. ඊට වඩා උසස් මෙහෙයක් තවත් නැත්තේ ම ය. අභාග්‍යයකට මෙන් දැන් දැන් ඇතැම් මවුවරු බුදු බණට පිටුපා ක්‍රියා කෙරෙති. ආර්‍ය්‍ය සිංහල චාරිත්‍රවලට පටහැනි ව ක්‍රියා කෙරෙති. ඇතැමෙක් පරසිරිත් හිස් මුදුනෙන් පිළිගනිති. දුම්, මත්පැන් පානය කරති. බයස්කෝප් මඩු බලා යති. බුදුබණ නො අසති. නො උගනිති. කුකුළන් ඇති කරති. උන් මරති. බිත්තර ද කති. බොහෝ මවුවරු අප බුදුරජාණන් වහන්සේ වදාළ ලෙස දරුවන් නො හික්මවති. මෙය වනාහි සිංහල ජාතික පරිහානියකි.

ලෝකයෙහි ඉතා ම සිල්වත් ස්ත්‍රී පක්ෂය නම්, අපේ සිංහල බෞද්ධ මවුවරුන් බව අවරදිග පණ්ඩිතයෝ ද කියති. ලියති. සිංහල බෞද්ධ ගැහැණු දරුවන් විසින් උතුම් බුද්ධාගමත්, අපේ ආර්‍ය්‍ය සිංහල සිරිතුත් රැකගත යුතු ය. අප බුදුපියාණන් වහන්සේ ස්ත්‍රී පක්ෂයට දැක්වූ මහාකරුණා මහිමය නිසා ලොවට සිදු වූ ශාන්තිය අනන්ත ය. ඒ නිසා විශේෂයෙන් බෞද්ධ මවුවරුන් හා දූවරුන් විසින් බුද්ධ ශාසනය කෙරෙහි වැඩියෙන් භක්තිමත් ව නන්දමාතා ආදීන් මෙන් සැදැහැවත් ව, සිල්වත් ව, ධර්මධර ව බුදුසස්න බබළවන්නට මේ වෙසක් පොහෝ දින අදිටන් කැරගත යුතු ය.

**තෙරුවන් බෙලෙන් සව් සත්නට සෙත් වේවා !**

(බෞද්ධ ළමයා -14 වන කාණ්ඩය, 1 වන කලාපය)



# සංඝශෝභන මාහිමිපාණෝ

(අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි ගුණ සමරුව නිමිත්තෙනි)
**අතිපූජ්‍ය අග්ගමහාපණ්ඩිත මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමියන් වහන්සේ විසිනි.**

"භික්ඛු භික්ඛවේ වියත්තෝ විනීතෝ විසාරදෝ බහුස්සුතෝ ධම්මධරෝ ධම්මානුධම්මපටිපන්නෝ සංඝං සෝභේති"

'මහණෙනි, ව්‍යක්ත විනීත විශාරද බහුශ්‍රැත ධර්මධර ධර්මානුධර්ම ප්‍රතිපන්න භික්ෂුව සංඝයා හොබවයි (ශාසනය බබුළුවයි) යැයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළහ. භික්ෂූන් වහන්සේ කෙබඳු ලක්ෂණයන් ගෙන් යුක්ත විය යුතු දැයි මෙයින් මැනැවින් ම පැහැදිලි ය.

බුදුරජාණන් වහන්සේ බුදු වූ ළඟදී ම උරුවේලාවෙහි වැඩ සිටින විට එහි පැමිණි මාරයා "ශ්‍රමණ භවත් ගෞතමයෙනි, කොහොම හරි බුදු වුණා නොවැ, දැන් ඉතින් පිරිනිවන් නොපාන්නේ මන්ද'යි කියමින් පිරිනිවන් පාන්නට ආරාධනා කෙළේ ය. එවිට බුදුරජාණන් වහන්සේ, මාරයෝ, මා බුදු වූයේ ඔහොම පිරිනිවන් පාන්නට නොවෙයි. මාගේ ශාසනය ව්‍යක්ත විනීතාදී සගුණයෙන් යුත් ශ්‍රාවකයන්ගෙන්, භික්ෂූන්ගෙන්, සම්පූර්ණ වනතුරු මා පිරිනිවන් පාන්නේ නැතැයි මාරයාට ප්‍රකාශ කළහ. බුදුරජාණන් වහන්සේ

බලාපොරොත්තු වූ භික්ෂු ලක්ෂණ, භික්ෂු ගුණ කවරේදැයි මෙයින් මැනැවින් පැහැදිලි වේ.

සම්බුද්ධ ශාසනය ආරක්ෂා කරන, බබුළුවන පිරිස මේ සගුණයෙන් සම්පූර්ණ භික්ෂු, භික්ෂුණී උපාසක උපාසිකා යැයි සිවු වැදෑරුම් වේ. එයින් භික්ෂූන් වහන්සේ ප්‍රධාන වෙති. බුද්ධ කාලයේ පටන් අද වන තුරුත් බුද්ධ ධර්මය ලොවට ගෙන ගියාහු භික්ෂූන් වහන්සේ ම ය. එය අදත් ඉදිරියටත් එසේ මැයි.

පූජ්‍යපාද හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමියන් වහන්සේ මේ සගුණයෙන් සම්පූර්ණ වෙමින් සංඝයා බැබැළවූ ශාසනය බැබැළවූ අතිශ්‍රේෂ්ඨ පුද්ගලයෙකි. උන් වහන්සේ කේන්දරයේ සාමාන්‍ය දර්ශනයෙන් අපුණ්‍යවන්තයකු ලෙස පෙනුණත් බුද්ධධර්මය අනුව මහා පුණ්‍යවන්තයෙකි. උන් වහන්සේ මෙබඳු කුඩා පොතෙකින් හඳුන්වා දිය හැක්කකු නොවුවත් සැකෙවින් පිළිවන් තරම් හොඳින් හඳුන්වා දී ඇත. උන් වහන්සේ විවිධ සේවා අතුරින් කිහිපයක් මෙසේ ය.

### 01. පිරිවෙන් අධ්‍යාපනය

හික්කඩුවේ සුමංගල ස්වාමීන් වහන්සේ මූලික අධ්‍යාපනය සිය ආචාර්යපාදයන් වහන්සේලා ගෙන් ලබාගෙන උසස් අධ්‍යාපනය සඳහා එකලැ කීර්තිධර අධ්‍යාපනායතනයක් වැ තුබුණු රත්මලානේ පරමධම්මචේතිය ආයතනයට පැමිණියහ. එවකට එහි චිරප්‍රසිද්ධ වැ සිටි වලානේ සිද්ධාර්ථ මාහිමියන් වහන්සේ වෙතින් අධ්‍යාපනය ලබා පසුව එහි ප්‍රධානාචාර්ය ධුරයට ද පත් වූහ.

අගනුවර පැමිණි හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමියන් වහන්සේ තාවකාලික නිවාසයක ආරම්භ කළ

අධ්‍යාපන කටයුතු දියුණු කිරීම සඳහා දායකවරුන් විසින් ස්ථිර ස්ථානයක් පිළියෙළ කරන ලදින් විද්‍යාධාර සභාව නමින් ප්‍රබල සංවිධානයක් ඇති කොට 1873 දෙසැම්බර් මාසයේ දී විද්‍යෝදය පිරිවෙන ආරම්භ කළහ. විද්‍යෝදය පිරිවෙන නිසා ශ්‍රී ලංකාවට සිදු වූ සේවය වචනයෙන් කියන්නට බැරි තරම් ශ්‍රේෂ්ඨ ය.

වැලිගම පැළෑණේ වුසූ තුඩාවේ පඬිතුමා අප ආචාර්යෝත්තම පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමියන් වහන්සේ ගේ පියා ය. එකලැ මාතර පළාතේ නිකායත්‍රයට ම අයත් සෑහෙන සංඛ්‍යාවක් භික්ෂූන් වහන්සේ ඉගෙන ගත්තේ තුඩාවේ පඬිතුමාගෙන් ය. එතුමා හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමියන් වහන්සේ සමඟ ද මිත්‍රකම් පැවැත්වූවා. පුතා පූජ්‍යපාද වේරගම්පිට සිරි රේවත මාහිමියන් වහන්සේ වෙත පැවිදි කරවා ටික කලකට පසු පඬිතුමා අභාවප්‍රාප්ත වුණා.

ටික කලකට පසු මෑණියන් ද සියපුත් වජිරඤාණ ස්වාමීන් වහන්සේ සමඟ විද්‍යෝදය පිරිවෙනට ගොස් හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමියන් වහන්සේ මුණග ෑසී 'මෙන්න, ඔබ වහන්සේ ගේ මිත්‍රයාගේ පුතා එක්ක ආවා. නායක මාහිමියන් වහන්සේට බාරයි' කීවා. උන්වහන්සේ ද ඉතා සතුටින් බාර ගෙන තමන් ගේ යුතුකම සම්පූර්ණ කළා. පැළෑණේ සිරි වජිරඤාණ ස්වාමීන් වහන්සේ ද ඉතා දක්ෂ ලෙස ඉගෙන තුන් අවුරුද්දකින් සියලු කටයුතු අවසන් කොට ස්‍යාමරාජ ත්‍යාගය ද දිනා ගත්තා.

### 02. උභයාංශ පාරුපනය

අසරණ සරණ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන් වහන්සේ ගේ පටන් සියම් නිකායේ භික්ෂූන් වහන්සේ

ඒකාංශ පාරුපනය කළහ. අමරපුර රාමඤ්ඤ දෙනිකායයේ භික්ෂූන් වහන්සේ උභයාංශ පාරුපනය කළහ. හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමියන් වහන්සේ ද උභයාංශ පාරුපනය පිළිගෙන දෙවුර ම වැසෙන සේ සිවුරු පෙරවීම කළහ. උන් වහන්සේ අනුගමනය කළ සියම් නිකායික භික්ෂූන් වහන්සේලා සෑහෙන සංඛ්‍යාවක් උභයාංශ පාරුපනය කළහ.

### 03. බෞද්ධ කොඩිය

සිංහ කොඩියේ නිර්මාතෘ දුටුගැමුණු මහරජතුමා ය. එහි විකාශය සිංහල බෞද්ධ කොඩිය යි. එනම් දකුණු අතට කඩුව ගත් සිංහයා හා කොන් හතරේ බෝ කොළ තිබෙන කොඩියයි. සිංහයා මේ රට සිංහල බව පෙන්නීමට ය. දකුණු අතට ගත් කඩුව, නිදහස් රාජ්‍යයක් බව පෙන්නීමට ය. කොන් හතරේ බෝ කොළ, සිංහල රට බෞද්ධ බව පෙන්නීමට ය. මෙකලැ තිබෙන ජාතික කොඩියේ පාට පටි දෙක සිංහල බෞද්ධ රටෙහි සුළු ජාතිකයනට දී තිබෙන සාධාරණ අයිතිවාසිකම් පෙන්නීමට ය.

මිහිඳු මහරහතන් වහන්සේ ගේ පැමිණීමෙන් පසු සිංහල රට බෞද්ධ විය. එයින් පොහොසත් හැඟීමත් සතර පොහොය නිවාඩුවත් ඇති විය. අද අප ඉතා උසස් කොට සලකන වෙසක් පුනු පොහොය විශේෂයක් නැති වැ සාමාන්‍ය පුනු පෙහොයක් හැටියට ම සලකන ලදී. වෙසක් විශේෂ උත්සවයක් ආරම්භ කෙළේ දුටුගැමුණු මහරජතුමා ය. විදේශීන් ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ පසු ව්‍යවහාර වර්ෂ 1770 දී ඕලන්ද ආණ්ඩුකාරතුමා විසින් ඉරිදා නිවාඩු පනතක් සම්මත කෙරෙමින් අවුරුදු 2078 ක් තිබුණු පොහොය නිවාඩුව නැති කරන ලදී. බෞද්ධයනට වෙසක්

පුනු පොහොය වත් නිවාඩු දුන්නේ නැත. බෞද්ධයනට සිදු කළ අසාධාරණකම්වල ප්‍රමාණයක් නැත.

1880 දී ඇමරිකන් ජාතික සෙන්පති හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාගේ පැමිණීමෙන් පසු සිංහල බෞද්ධයෝ මහත් ප්‍රබෝධයට පත් වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1880 දී බෞද්ධ පරම විඥානාර්ථ සමිතියත් 1884 දී බෞද්ධ ආරක්ෂක කමිටුවත් පත් කරගන්නා ලදි. සෙන්පති ඕල්කට් තුමාගේ මූලිකත්වයෙන් ආරම්භ කළ බෞද්ධ ආරක්ෂක කමිටුවේ ප්‍රධාන අනුශාසකවරුන් හැටියට ක්‍රියා කළෝ හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමියන් වහන්සේත් මොහොට්ටිවත්තේ ගුණානන්ද මාහිමියන් වහන්සේත් ය. සභාපති මුහන්දිරම් ඒ. පී. ධර්ම ගුණවර්ධන මහතා ය. උපසභාපති දොන් කරෝලිස් හේවාවිතාරණ මහතා ය. ලේකම් කරෝලිස් පූජිතගුණවර්ධන මහතා ය.

1883 මාර්තු 25 වැනිදා පොලිසියේ ද අවසර ඇති වැ දීපදුත්තාරාමය බලා ගිය බෞද්ධ පෙරහැරට කොටහේනේ දී පහර දී මහා විනාශයක් කළා. මහත් අසරණ බවට පත් වූ බෞද්ධයන්ගේ සන්දේශය රැගෙන එංගලන්තයට ගිය ඕල්කට්තුමා බ්‍රිතාන්‍ය රජයට කරුණු පැහැදිලි කැර දී වෙසක් දින නිවාඩු දීමේ අවශ්‍යතාව ද පෙන්වා දී ආපසු ලංකාවට පැමිණ තොරතුරු කියා නැවතත් මදුරාසියේ අඩියාර්හි පරමවිඥානාර්ථ සමිතියේ මූලාසනයට ගියා.

වෙසක් පොහොය නිවාඩු දීමේ අවශ්‍යතාව පිළිගත් බ්‍රිතාන්‍ය රජය 1885 මාර්තු 27 වැනිද ගැසට් නිවේදනයෙන් ඉදිරි වෙසක් දා සිට වෙසක් දින නිවාඩු යැයි ප්‍රකාශ කළා. ඒ වර්ෂයේ වෙසක් පුනු පොහොය යෙදී තිබුණේ අප්‍රේල් 28 වනදාට ය. බලවත් ප්‍රීතියට පත් වුණු බෞද්ධ ආරක්ෂක

කමිටුව වහා ම රැස්වී වෙසක් උත්සවය මහ ඉහළින් පැවැත්වීමට හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමියන් වහන්සේ, මොහොට්ටිවත්තේ ගුණානන්ද මාහිමියන් වහන්සේ ද ඇතුළු විශේෂ කමිටුව රැස්වී සාකච්ඡා කොට බෞද්ධ කොඩියක් තනා ඔසවන්නට නියම කරගන්නා ලදි. බෞද්ධ කොඩියට සවනක් බුදුරැස් යොදා කොඩියක් පිළියෙල කැරගෙන එන්නට ඇතැමුන්ට නියම කළා. බෞද්ධ ආරක්ෂක කමිටුවේ ලේකම් කරෝලිස් පූජිත ගුණවර්ධන මහතා විසින් පිළියෙල කොට ගෙනෙන ලද කොඩිය සුදුසු යැයි කමිටුව පිළිගත්තා. ටික කලකට පසුව නැවතත් ලංකාවට පැමිණි සෙන්පති ඕල්කට් තුමා කොඩිය දැක සතුටට පත් වී කොඩිය ප්‍රමාණයෙන් දිග වැඩි බව කියා දිග පළල සම කළා. ටික කලෙකට පෙර විද්‍යොදය පිරිවෙන්හි පැවැති මහා උත්සවයේ එක් අංගයක් ලෙස යොදා තිබුණු චිත්‍ර ප්‍රදර්ශනයෙහි ඓතිහාසික චිත්‍ර අතර බෞද්ධ කොඩිය පිළිබඳ චිත්‍රයෙහි හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමියන් වහන්සේගේත් සෙන්පති ඕල්කට්තුමාගේත් කරෝලිස් පූජිත ගුණවර්ධන මහතාගේත් රූ සටහන් පෙනෙන්නට තුබුණා මතකයි.

පූජ්‍යපාද හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමියන් වහන්සේ ගේ ශාසන සේවයත් සාහිත්‍ය සේවයත් ජාතික සේවයත් සමාජ සේවයත් ඉතා පුළුල් ය. එයින් සුළු කොටසක් මෙහි සැකෙවින් සඳහන් විණි. හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමියන් වහන්සේට නිවන් සුව අත්වේවා'යි ඉත සිතින් ප්‍රාර්ථනා කෙරෙමි.



# සාර්ථක ජීවිතයකට අවශ්‍ය ගුණධර්ම

**පූජ්‍ය සූරියගොඩ සිරිධම්ම අධිකරණ නාහිමිපාණන් විසිනි.**

ලෝකයේ ප්‍රධාන ම සත්වයා මිනිසා බව අවිවාදයෙන් පිළිගත් කරුණකි. බුදු දහමට අනුව ද මිනිසා කේන්ද්‍රකොටගෙන ලොව ම පවතින බව ඉගැන්වේ. මිනිසාගේ වාද භේද දිව්‍ය බ්‍රහ්මයන් අතරට පවා යන බව මංගල සූත්‍ර නිදාන කථාවෙන් පැහැදිලි වෙයි. මේ නිසා මිනිස් සන්තානය කිළිටි කරන කරුණු මොනවාදැයි දැන කියාගෙන ඒවායින් මිදී පාරිශුද්ධත්වය ළඟා කරගත යුතු ය. අංගුත්තර නිකායේ අට්ඨක වර්ගයේ මල සූත්‍රයෙන් මිනිස් ජීවිතය කිළිටි කරන කරුණු අටක් දක්වා ඇත. එනම්,

1. පාඩම් කල දෑ සිහි නොකිරීම
2. උත්සාහවන්තව ගේ දොර පිළිසකර නො කිරීම.
3. කුසීතකම
4. ප්‍රමාදය
5. දුශ්චරිතය ස්ත්‍රියට මලකඩකි
6. දෙන්නාට ලෝභය මලකඩකි
7. පව් කිරීම දෙලොවට ම මලකඩකි
8. අවිජ්ජාව බරපතළ ම මලකඩකි

පාඩම් කළ දෑ නැවත නැවත මෙනෙහි නො කළහොත් එම ශිල්ප ශාස්ත්‍ර මල කනු නො අනුමාන ය. ධම්මපදයෙහි "මල" නමින් වර්ගයක් ම සංග්‍රහ කොට ඇත. එහි ද පාඩම් කළ දෑ මෙනෙහි නො කරනවා නම් සිහිපත් නො කරනවා නම් ඒවාහි ප්‍රායෝගිකව නො යෙදෙනවා නම් මලබැඳෙන බව "**අසජ්ඣාය මලා මන්තා**" යනුවෙන් දේශනා කොට ඇත. ලාලුදායී භික්ෂූන් වහන්සේ ජීවත් වූයේ බුද්ධ කාලයෙහි ය. උන්වහන්සේ ත්‍රිපිටකය ම කටපාඩම් කළහ. එහෙත් නැවත සිහිපත් කිරීමක් කළේ නැත. සැරියුත්, මුගලන්, මහා කාශ්‍යප ආදී මහ රහතන් වහන්සේ පැමිණෙන මිනිසුන්ට දම් දෙසති. ඒ බණ අසන මිනිසුන් බණ කීම පිළිබඳව ප්‍රශංසාත්මකව කථා කරති. එම කථා ඇසූ ලාලුදායී තෙරණුවෝ " ඇයි සැරියුත්, මුගලන් ආදී තෙරවරුන්ට විතරද බණ කියන්න පුළුවන්. අපට බැරි ද ? " යනුවෙන් කීහ. ඒ ඇසූ මිනිස්සු එසේ නම් ඔබ වහන්සේ අපට ධර්මය දේශනා කරන්න යයි ආරාධනා කළහ. එම ආරාධනාව පිළිගත් ලාලුදායී තෙර ධර්මදේශනාව පැවැත්වීමට ධර්මාසනාරූඪ විය. ගාථාවක් සූත්‍ර ධර්මයක් සිහිපත් කළත් සිහිපත් වුණේ නැත. කොතෙක් කල්පනා කළත් සිහියට නාවේය. මේ වෙලාවේ මට ධර්මය දේශනා කළ නො හැකි ය. දවල්ට දේශනා කරමි. ධර්මාසනයෙන් බැස ගියේ ය. දවල් කාලයේ ද සිදු වූයේ ඒ ටිකමය. හැන්දෑ වරුවේ ද බණ කියන්නට ධර්මාසනාරූඪ විය. එහෙත් බණ පදයක් වත් සිහි නොවී ය. මහජනයා කලබල විය.

"මේ ලාලුදායී...... බණ කියනවා කියල අපව මුලා කළා. අපට වෙන හාමුදුරු නමකගෙන් බණ අහන්නත් තිබුණා. එයත් නැති කළා." යයි දොස් නගන විට බිය වී පැන දිව්වේ ය. එසේ දුවන ලාලුදායී තෙරණුවෝ පරණ වැසිකිළි වළකට වැටී මහා කරදරයකට පත් වූහ. මෙම සිද්ධිය බුදුරජාණන් වහන්සේට ද ආරංචි වී "**අසජ්ඣාය මලා මන්තා**" යනාදී දේශනාව කළ සේක.

ලාලුදායී තෙරණුවෝ ත්‍රිපිටකය ම හදාරා ඇතත් ධර්මදේශනා කරන්නට ගිය විට සිහිපත් නූයේ නැවත සිහිපත් නොකළ නිසා ය. එසේ මොන යම් හෝ ශාස්ත්‍රයක් උගෙන ඒවා නිතර භාවිත නො කළහොත් මල බැඳෙන්නේය. මල බැඳුණ විට එම ශාස්ත්‍රයෙන් වැඩක ගත නොහැකි තත්ත්වයට පත්වනු ඇත.

මේ නිසා  බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත්තේ "**සුතා - ධතා - වචසා  පරිචිතා - මනසානුපෙක්ඛිතා**" ඇසුව දේ ධාරණය කරගැනීම - ධාරණය කළ දෙය ප්‍රායෝගික පුහුණු වීම - ප්‍රායෝගිකව පුහුණු වූ දේ පිළිබඳ ව නැවත මෙනෙහි කර බලන ලෙසත් ය. ප්‍රඥාව ලැබෙන්නේ කෙසේ දැයි ආලවක නැඟූ පැනයට බුදුරදහු පිළිතුරු දී ඇත්තේ "**සුස්සූසා ලභතෙ පඤ්ඤා**" ඇසීමෙන් ප්‍රඥාව ලැබෙන බව යි.

ධර්මානුකූලව බුදු, පසේබුදු, උතුමන් වහන්සේ නමකට හැර වෙනත් කෙනෙකුගෙන් නො අසා ධර්මාවබෝධය ලැබිය නොහැකි ය. එය "**පරතෝඝොස ප්‍රත්‍යය**" නමින් හඳුන්වා ඇත. ගෞතම බුද්ධශාසනයෙහි නුවණින් අගතැන් ලැබුයේ සැරියුත් මහරහතන් වහන්සේ ය. එහෙත් උන්වහන්සේට පවා එදා අස්සජි මහරහතන් වහන්සේගෙන් "**යෙ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතො ආහ**" යන ගාථා දෙපදය අසන තුරු ධර්මාවබෝධය නො ලැබුණි. පෙර පැවතියේ ඇසීම යි. වර්තමානයේ  ඇත්තේ බහුල වශයෙන් කියැවීම යි. එනිසා "**කියැවීම සම්පූර්ණ මිනිසකු තනයි**" යනු බුදුවදන ම මෙකලට ගැළපෙන සේ සකසා කියූවකි.

දෙවැනි මලකඩ නම් උත්සාහවන්තව ගේ දොර පිළිසකර නො කිරීමයි. "**අනුට්ඨාන මලා ඝරා**" යනුවෙන් දක්වා ඇත්තේ එය යි. සෑම මිනිසකුට ම හිසට සෙවණක් තිබිය යුතු ය. එම සෙවණ හෙවත් ගෙදර එහි වෙසෙන මිනිසුන්ගේ තත්ත්වය

- ස්වභාවය පිළිබිඹු කෙරෙන කැඩපතෙකි. කුඩා පැල්පතක් වුවත් පිරිසිදුව ක්‍රමානුකූලව ඒ ඒ භාණ්ඩ නිසි පරිදි තැන්පත් කර පිළිවෙළකට තබා ගන්නේ නම් එම නිවසට සිරිකත බැලුම් හෙළනු නිසැක ය. උත්සාහවත් නොවී වහලයේ තෙමෙන තැන් වලට පිළියම් නො කොට, දිරාපත් තැන් ප්‍රතිසංස්කරණය නො කොට බඩු බාහිරාදිය පිළිවෙළකට නො තබන්නේ නම් එය නිවසට මලයකි. එබඳු නිවෙස්වලට අරක්ගන්නේ මූදේවිය යි.

මිනිස් ජීවිතයක් අසාර්ථක වන ප්‍රධාන කරුණකි, කුසීතකම. කම්මැළියාට දිවැස් තිබෙනවා යැයි සමාජයෙහි ප්‍රවාදයක් ප්‍රචලිතව ඇත. ඒ කම්මැළියා ඒ ඒ කරුණු සිතා කියා වැඩ කටයුතු අතපසු කරන නිසා ය. සමහර අය වැඩක් පටන් ගන්නා විට දහසකුත් එකක් හේතු සාධක ඉදිරිපත් කොට ඒ වැඩය අතපසු කර දමති. කෙනෙකුට වැඩක් පටන් ගැනීමට ධෛර්යයක් තිබිය යුතු ය. එය ආරම්භ ධාතු නමින් ධර්මයෙහි දක්වා ඇත. නික්ඛම ධාතු නමින් හැඳින්වෙන්නේ පටන් ගත් කටයුත්ත කෙතෙක් බාධක පැමිණියත් කරගෙන යාමේ ශක්තිය යි. පරක්කම ධාතු නම් පටන්ගත් කටයුත්ත නිමාවන තුරු කරගෙන යෑමේ ධෛර්යය යි. මෙබඳු උත්සාහවන්ත මිනිසුන්ගේ ජීවිතය අතිශයින් සාර්ථක භාවයට පත්වෙයි. උත්සාහවන්තයාට නොකළ හැකි දෙයක් නැති බව බුදුරජාණන් වහන්සේ ද දේශනා කොට ඇත. කුසීතයාගේ ස්වභාවය සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇත්තේ **"අතිසීතං අතිඋණ්හං - අතිසායමිදං අහු"** ආදී වශයෙන් එයින් පැහැදිලි කෙරෙන්නේ කම්මැළියා දැන් ඉතා සීත ය. දැන් උෂ්ණ ය. දැන් බඩගිනි ය. ආදී වශයෙන් තම වැඩ කටයුතු කල්යවන බව යි. එයින් සිදුවන්නේ ජීවිතය තව තවත් පරිහානිය කරා ළඟාවීම යි.

සතර වැනි මළ ධර්මය නම් ප්‍රමාදය යි. එහි විරුද්ධ වචනය අප්‍රමාදය යි. සාමාන්‍යයෙන් වැඩ කටයුතු කිරීමේ දී මැළි බවින් සෙමින් සෙමින් වැඩ කිරීම ව්‍යවහාරයේ පවත්නා ප්‍රමාදය යි. ධර්මයෙහි ඊට වඩා ගැඹුරු අරුතක් පමාද - අප්පමාද යන වචනයන්හි ඇත. "**පමාදො සති වොස්සග්ගො**" ප්‍රමාදය නම් සිහි මුළාවීම යි. සිහිය නුමුළා වීම, සිහිය පිහිටුවා ගැනීම අප්‍රමාදය යි. "**අප්පමාදො අමතපදං - පමාදො මච්චුනො පදං**" යනුවෙන් අප්‍රමාදය නිවනට හේතුවන බවත් - ප්‍රමාදය මාරයාට අවස්ථාව සලසන බවත් ධම්මපදයෙහි දක්වා ඇත. බුදුරජාණන් වහන්සේ ගේ අවසන් අවවාදය වූයේත් "**අප්පමාදෙන සම්පාදෙථ**" යන්න යි. මෙම අප්පමාද යන වචනයෙහි මුළු ත්‍රිපිටක බුද්ධ වචනය ම දක්වා ඇති බව පැවසේ.

පස්වන මලකඩ කාන්තා චරිතයට වෙසෙසා ඇත. එනම් දුශ්චරිතය යි. දුශ්චරිතය පුරුෂ පක්ෂය කෙරෙහි ද බලපායි. එහෙත් කාන්තාවකට දුශ්චරිතය ඉතා දැඩිව බලපායි. ඒ නිසා දුශ්චරිතය ස්ත්‍රියට මලකඩ ලෙස දක්වා ඇත. ලෝක චාරිත්‍රයට අනුව කාන්තාවක් පුරුෂයකු සමග සම්බන්ධ විය යුතු ය. දුශ්චරිතයෙන් යුත් කාන්තාවක් කිසි ම පුරුෂයෙකු ලබා ගැනීමට කැමති නැත. එසේ ම එබඳු ස්ත්‍රියක් ආවාහ - විවාහ ආදී කටයුතු කරගත්තත් එම පවුල් ජීවිතය අසාර්ථක ය. බොහෝවිට කඩාකප්පල් වන්නේ ය.

ලෝභය නම් තමා සතු දේ අනුන්ට නොදී ආශාවෙන් පොදි බැඳ ගැනීම යි. එය ද මලකඩකි. දැඩි ලෝභීහු අනුන් ගේ වස්තුව ද අත්පත් කර ගැනීමට මාන බලති. මසුරු සිටාණන් වැනි අය දෙනවා තබා තමාවත් නොකා නොබී වස්තුව හම්බ කළහ. දහමට අනුව වස්තුව හරිහම්බ කරන්නේ කෑම බීමට හා යුතුකම් ඉටු කිරීමට ය. ධනය පරිහරණය කළ යුතු ආකාරය සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇත. බෞද්ධයකු තුළ

අර- පරිස්සම තිබිය යුතු ය. එනම් වස්තුව ධනය නිකරුණේ නාස්තිකර නො දැමීමත් නිසි ලෙසට විය පැහැදම් කිරීමත් ය.

පාපය ද දෙ ලොවට ම මලකඩකි. පාපකාරී ජීවිත ගත කරන්නෝ මෙලොවත් තැවෙති. පරලොවත් තැවෙති. මා විසින් පව් කරන ලදැයි තැවෙති. පරලොව සැපවත් වී කළ පව්වල විපාක විඳවන විට බෙහෙවින් ම තැවෙති. මේ සැම දේකටම මුල, හේතුව අවිද්‍යාවයි. අනිත්‍ය ස්වභාවය, දුක්ඛ ස්වභාවය, අනාත්ම තත්ත්වය නො දැනීම යි. ඒ නිසා මම ය, මාගේ ය යනුවෙන් අල්ලාගෙන සසර දුක් විඳිති. විද්‍යාව උපදවා ගැනීමෙන් සත්‍ය ස්වභාවය අවබෝධ කර ගත හැකි ය. එවිට අල්ලා ගැනීමක් නැත. නිවනට පත්විය හැක්කේ සැම දෙයක් ම අත්හැරීමෙනි.

යථාභූතඥානයෙන් විරහිත වූ අන්ධ බාල සිංහලයා තමාට අයිති ධනය තමා ගේ රට දියුණුවට වියදම් නොකොට යුරෝපීය සිරිත්වලට අනුව කල්යවමින් තමා ගේ ධනය නාස්ති කරගනී. යුරෝපීය සිරිත් ගැනීම අනභිවෘද්ධියට හේතු වන්නේ ය. වස්ත්‍රය පවා පිටරටින් ගෙන්නාගෙන අඳින එක ම ජාතිය සිංහල ජාතිය යි. ධනවත් සිංහලයන්ට ප්‍රඥාචක්ෂුව නැති බැවින් ස්වකීය ජාතිය, රට, ආගම, භාෂාව, ශාස්ත්‍ර ශිල්ප දියුණුවට ක්‍රියා නොකරත්. අප තිලෝගුරු සර්වඥයන්වහන්සේ විසින් වජ්ජිපුත්‍ර ලිච්ඡවීන්ට ප්‍රකාශ කර වදාළ සප්තවිධ අපරිහානි ධර්ම භාවිත කිරීමට සිංහලයන් විසින් ආරම්භ කට යුතු යි. බාල කාලයේ පටන් ම සිංහල දරුවන්ට මේ අපරිහානි ධර්ම උද්ග්‍රහණය කට යුතු ය.

**''අනගාරික ධර්මපාල දැනගත යුතු කරුණු'' කෘතියෙනි.**



# මහා උක්කුස ජාතකය

කොළඹ විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණි
**ලක්ෂ්මි පෙරේරා මහත්මනිය විසිනි.**

තිලෝගුරු අප සම්මා සම්බුදුපියාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන කල, එක් උපාසක උපාසිකා යුවළක් වෙනුවෙන් මෙම ජාතකය දේශනා කළ සේක.

මෙම උපාසක උපාසිකා යුවළ විටෙක මිතුරෙකු සහ මිතුරියක වැන්න. විටෙක තම නෑදෑයිනට මිතුරු මිතුරියනට ආගන්තුක සත්කාරයෙහි නියැලුණහ. තවත් විටෙක පැවැත්වූයේ ගුරු ගෝළ සම්බන්ධයකි. ඒ දෙදෙනාම එකිනෙකාගේ අවවාද පිළිගත් නිසා ය. අදහස්වලට ගරු කළ නිසා ය. මේ ආදර්ශවත් යුවළ ගැන භික්ෂූන් වහන්සේලා පවා කථා කළ බැවින් අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ මෙවන් උතුම් ගුණාංගවලට හේතු දක්වා අතීත කථාව වදාළ සේක.

ඈත අතීතයේ මෙම උපාසක උපාසිකා යුවළ උකුස්සන් ලෙස ජීවත් වූහ. ඒ බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු පාලනය කළ සමයයි. එක් විලක් අසල මේ උකුසු යුවළ ද, ගිජුලිහිණියෙකු ද කැස්බෑවෙක් ද, සිංහයෙක් ද මිතුරුව වාසය කළහ.

එක් දිනක් උකුසු යුවළගේ පැටවුන් අල්ලා ගැනීමට දඩයක්කාරයින් පිරිසක් පැමිණියහ. ඔවුන්ගේ අදහස් වූයේ

උකුසු පවුල වාසය කළ උසැති ගසට ගිනි තැබීම ය. එක් දඩයක්කරුවෙක් ගිනි හුලක් රැගෙන පැමිණියේ ය. අසරණ වූ උකුස්සිය වහා පියාඹා ගොස් ගිජුලිහිණියාට මේ බව සැලකර, පැටවුන් බේරා දෙන්නැයි ඉල්ලා සිටියා ය. එවිට ගිජුලිහිණියා තම හොටෙන් හා පියාපත් වලින් ජලය ගෙන ගොස් ගිනිහුල නිවා දැමීමට උත්සාහ කළා ය. කිහිපවරක් විලෙහි ගිලෙමින් ජලය ගෙන ආ බැවින් ගිජුලිහිණියා වෙහෙසට පත් වූවා. මෙය දුටු උකුසු මව පැටවුන් බේරා දෙන ලෙස කැස්බෑවාගෙන් ඉල්ලා සිටියා ය.

කැස්බෑවා විලට ගොස්, විලට බැස දිය සෙවෙල් ඇඟෙහි පටලවාගෙන, මඩ ඇඟෙහි තවරාගෙන ගිනිගෙන දැවෙන වියළි කොළ මතින් එහා මෙහා යන්නට පටන් ගති. එවිට ගින්න ටිකෙන් ටික නිවී ගියේ ය. කැස්බෑවා දුටු දඩයක්කාරයෝ උකුසු පැටවුන් අල්ලා ගැනීම පසෙක තබා, කැස්බෑවා අල්ලා ගැනීමට උනන්දු වූහ. කැස්බෑවාගේ ශරීරය වටා දිය සෙවල එතී තිබූ නිසාත්, මඩ තැවරී තිබූ නිසාත් දඩයක්කාරයින්ගේ උත්සාහය අසාර්ථක විය. කැස්බෑවාගේ ජීවිතය අනතුරට පත් වී ඇති බව උකුසු මව සිංහයාට පවසා සිටියා ය. සිංහයා පැමිණ දඩයම් කරුවන් බිය ගන්වා, එළවා දමා උකුසු පැටවුන් ද, කැස්බෑවා ද බේරාගත්තේ ය.

මෙම මිතුරු කණ්ඩායම, මිය යන තුරුම තම මිතුරු දම රැකගත්හ. උකුස්සිය මිතු දහමෙහි අනුහස් සැමට වටහා දුන්නා ය. එනම් මිතුරන් සැමවිට ම එකිනෙකා ගැන හැඟීමෙන් කටයුතු කළ යුතු යි. එකිනෙකාට පිහිට විය යුතු යි. එකිනෙකා ආරක්ෂා කළ යුතුයි. මෙවැනි මිතුරන් අප ද ඇති කර ගත හොත් ඔවුන් අප ගේ ජීවිත කාලය පුරාවට අප සමඟ සිටීවි.

එකල උකුසු යුවළ, මේ උපාසක උපාසිකාව ය, කැස්බෑවා මුගලන් තෙර ය. ගිජුලිහිණියා සැරියුත් තෙරණුවෝ ය. සිංහ රජ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ ය.



# බක් උදානය

**ආචාර්ය එච්.ඒ.පී. අභයවර්ධන සූරීන් විසිනි**

තුරුලිය මල්කැන් බරින් පිරී
නියදම් ඉසුරෙන් පැහැපත් වී
බැබළෙන සමයයි භාග්‍ය මාසය
බක් මස පොහො දිනයෙන් කියැවෙන්නේ

බුදු පදවිය ලද පස්වැනි වසරේ
යුදගිනි දැල්වුණි බක් මාසේ
නාගදිව වැඩියෙන් සම්බුදු මාහිමි
දෙමයිල් නාරජු සමගි වුණේ

මණි අක් නා රජු කැලණි පුරවරේ
ඇරයුම් පිළිගෙන වැඩ එම පුරයට
බුදු පහසින් පතුරා ගිම් සිසිලස
පුන දෙව්රම් වෙත වැඩම කළේ

බක් මස පොහොදින සිතුවිලි නිදහස
ගැබ් වූ දහමකි පළට කළේ
රෝහිනි නදියේ දියවර මුල් කොට
නැගි කලහය විසඳා ලූයේ

"නහී වේරේන වේරාණි - සම්මන්තීධ කුදාචනං"
දහමකි ලෝ තුළ පවතින හැමකල්
බක් මස දෙසු දම් නය පවසන්නේ
දහමයි පවතින සදාතනේ

(මැදින් කලබ හා සබැඳේ)



# මලක සුවඳ

(කෙටි කතාව)

**සිරි වජිරාරාමවාසී පූජ්‍ය පිටිපන සාසනරතන හිමිපාණන් විසිනි**

ආත්තම්මේ ඔය ඇහෙන්නෙ පන්සලේ ඝණ්ඨාර හඬ නේ ද? හාමුදුරුවන්ට මොකක්හරි කරදරයක්ද දන්නෙ නෑ නේ ද ආත්තම්මේ........

නෑ මගෙ පුතේ, ඒ හවස පූජාවට වෙලාව ළඟයි කියල දැනුම් දෙන විදිහ.

අර ඈත පෙනෙන්නේ වෙහෙර වහන්සේගේ සුදු පාට කොත් කැරැල්ල අපි දෙන්නා පය ඉක්මන් කරල පන්සලට යමු.

අන්න ආත්තම්මේ පොඩි හාමුදුරුවො මිදුල අතුගානවා. හා හා පුතේ මිදුල අතුගානවා නෙමේ මිදුල අමදිනවා. සමාවෙන්න ආත්තම්මෙ මට වැරදුණා..... පුතා අහල තියෙනවද වැරදි කිරීම මනුස්ස ගතියක් සමාව දීම දේව ගතියක් කියලා.....ඔව් ආත්තම්මේ මට ආත්තම්ම ම තමයි ඔය දේ කියල දුන්නේ........ හැබැයි පුතේ හැමවෙලාවේ ම වැරදි කර කර සමාව ඉල්ලන එකත් එතරම් හොඳ දෙයක් නෙමේ......

බලන්නකො මගෙ පුතේ පොඩි හාමුදුරුවො බොහොම ලස්සනට මිදුල ඇමදලා තියෙන හැටි. ඒක තමයි ආත්තම්මෙ ගොඩක් ලස්සනයි...

අපි දෙන්න හෙමිහිට පොඩි හාමුදුරුවො ඉන්න දිසාවට යමු. පොඩි හාමුදුරුවො භාවනා කරමින් අමදිනවාද දන්නෙ නෑ නෙ......

ආත්තම්මේ භාවනා කරමින් අමදින්නේ කොහොමද ?

මගෙ පුතේ අමදින කොට ඒ ගැන අවධානයෙන් යුතුව සිහියෙන් ඒ වැඩය සිදු කරන කොට ඒකත් එක් විදිහක භාවනාවක් තමයි. එතකොට අපි ඉගෙනගන්න එකත් භාවනාවක් ද? ඔව් පුතේ ගුරුතුමිය කියල දෙන පාඩම සිහියෙන් හොඳින් අහගෙන ඉන්නවා කියන්නෙත් භාවනාවක් තමයි....

අවසරයි අපෙ හාමුදුරුවනේ. ඔබ වහන්සේ බොහොම ලස්සනට මිදුල ඇමදලා තියෙනවා. හිත නිවෙනවා මේ රටා දැක්කම

උපාසක අම්මේ මේ බිම මැවුණු රටා උණත් අනියතයි. තව ටික වේලාවකින් මේ රටා නැති වෙලා වළ ගොඩැලි විතරක් තියෙන බිමක් වෙනවා. වෙනස් වන ලෝකයේ කොතරම් ලස්සන වටිනා දෙයක් උණත් ඒ දෙය එලෙසින් ම පවතින්නේ නෑ. මේ ලෝකයේ ඇතිවන සියලු දෙයට ම පොදු වූ අනෙක් කාරණය තමයි පැවතීම හා නැතිවීම.

ඒ දෙය මේ ලෝකයේ කාටවත් වෙනස් කරන්නට බැහැ. ඒක තමයි සොබාදහමේ නීතිය. සොබාදහමෙන් අපට උගත හැකි මේ වටිනා කාරණය අපේ බුදු හාමුදුරුවෝ ධර්මය තුළ ලස්සනට පැහැදිලි කරල තියෙනවා. ඒ ධර්ම කරුණු කියවන කොට තමයි වැටහෙන්නේ බුදු හාමුදුරුවො කියන පිවිතුරු සුදු නෙළුම් මලෙහි ඇති වටිනාකම. අර ගාථාවකත් සඳහන් වෙන්නෙ......

**පුණ්ඩරීකං යථා වග්ගු - තෝයේන නුපලිප්පති**
**නූපලිත්තොම්හි ලෝකේන - තස්මා බුද්ධෝස්මි බ්‍රාහ්මණ**

බුදු හාමුදුරුවො නැමැති පද්මය පොකුණ නැමැති සමාජයේ ඉපිද එයින්ම පෝෂණය ලබා ගනී. එහෙත් උන්වහන්සේ මඩ හෝ ජලය නැමැති කෙලස් නො තවරා ගනී............

අපේ පොඩි මහත්තයත් ඇවිත් ඉන්නෙ ආත්තම්ම එක්ක. තකහනියක් ම මොකද මේ උපාසක අම්මා පන්සල පැත්තෙ....අනේ අපේ හාමුදුරුවනේ මගේ මේ මුණුපුරාට පොඩි දහම් කරුණු ටිකක් දැනගන්න ඕනෙලු ඔබ වහන්සේගෙන්.................

ආ ඒක බොහොම හොඳ දෙයක්. පුංචි කාලේ ඉඳලා පන්සල හාමුදුරුවරු ධර්මය ඇසුරු කරගෙන හැදෙන ළමයට කවදාවත් වරදින්නේ නෑ...........මොකද පන්සල කියන්නේ අපේ ඇත්තන්ගෙ සාමාන්‍ය මෙන් ම ආධ්‍යාත්මික ජීවිතය ද සංවර්ධනය කරන තිඹිරිගෙය වගේ තැනක්නෙ....

ඒත් ඉතින් කීයෙන් කී දෙනාද මේ ගැන තේරුම් බේරුම් ඇතිව කටයුතු කරන්නේ. දවසින් දවස පිරිහෙන සමාජයේ මිනිසුන් පුහුදුන් ආශාවන් පස්සෙ හඹාගෙන යනව මිසක් තමන්ගෙ සිතුවිලි දමනය කරගන්න බලන්නෙවත් නැහැ නේ. ඉතින් මේ සියලු රඟපෑම් වලට පස්සේ තමන්ගේ රටට ජාතියට අඩුතරමේ තමන්ගේ දෙමාපියන්ටවත් යුතුකම් ඉටුනොකර නිකම්ම පොළවට පස් වෙලා යනවා............

ඉතින්, පුංචි මහත්තයාට නම් තවම මේවා තේරෙන්නේ නෑ. උපාසක අම්මා මේවා ගැන තේරුම් බේරුම් කරලා දෙන්න ඕනෙ මේ මල් වගේ රටේ අනාගතය බාරගන්න ඉන්න මේ දරුවන්ට.......

හොඳයි පුංචි මහත්තයා අහමු බලන්න ඔය බැරෑරුම් ප්‍රශ්නය..............

අවසරයි හාමුදුරුවනේ.............

අපේ ආත්තම්ම මට කතාවක් කියල දුන්නා. ඒක අහගෙන ඉන්නකොට මට මෙහෙම දෙයක් හිතුණා........ඒ තමයි, " අපි ජීවත් වෙන පරිසරය විනාශ කරන්නේ මේ මිනිසා ම නේ ද " කියලා

දරුවෝ, පරිසරය විනාශ වෙන්නත් ලස්සන වෙන්නත් මේ දෙකට ම මුල මිනිසාම තමයි. විවිධාකාර සිතුම් පැතුම් තියෙන මිනිසුන් මේ ලෝකෙ ජීවත් වෙන්නේ. ඉතින් එයාලගෙ ක්‍රියාකාරකමුත් එකිනෙකට වෙනස්. යහපත් හොඳ වැඩ කරන අය වගේ ම අයහපත් වැරදි වැඩ කරන අයත් ඉන්නවා....මේ දෙය සිදු උනේ අද ඊයෙක නෙමේ පුංචි මහත්තයෝ..........මේ ලෝකෙ මිනිසා කියන සත්වයා බොහොම කෑදර කෙනෙක්. කොහොම හරි උත්සාහ ගන්නේ ධනය බලය යොදවලා අනිත් අයව විනාශ කරල හරි තමන් රජ වෙන්න. දවසින් දවස අනුන්ව තළා පෙළා අනුන්ට දුක් දෙන අය වැඩි වෙන්න වැඩි වෙන්න එයාලාගේ නරක නපුරු වැඩ නිසාත්, සිතිවිලි නිසාත් ලෝකය කුරිරු වෙනවා මෙන් ම පරිසරයත් විනාශ වෙනවා. මොකද පරිසරය වගේ ම මිනිසාත් සොබාදහමට තමයි අයිති.

මේ ලෝකය ඇති වුණ දා පටන් ඉදිරියට පැමිණි ගමන කොයි වගේ ද කියලා දැන ගන්නට පුළුවන් වටිනා සූත්‍රයක් සඳහන් වෙලා තියෙනවා ත්‍රිපිටකයේ....... පොඩි මහත්තයා දන්නවාද ත්‍රිපිටකයේ මොනවාද තියෙන්නේ......... බුදු හාමුදුරුවන් අවබෝධ කරගත් ධර්මය වගේ ම බුද්ධ ශ්‍රාවකයන් වහන්සේලා දේශනා කළ කුඩා ධර්ම කරුණුත් නේ ද ස්වාමීන් වහන්ස........

හොඳයි............

එතකොට ත්‍රිපිටකයේ කොටස් කීයද? කියමු බලන්න, තුනයි හාමුදුරුවනේ............ සූත්‍ර පිටකය විතරයි මම දන්නේ හාමුදුරුවනේ............

තවත් පිටක දෙකක් තියෙනවා පොඩි මහත්තයෝ..........ඒවාට තමයි විනය හා අභිධර්මය කියන්නේ..........

අද මම කියලා දෙන්නේ සූත්‍ර පිටකයේ තියෙන සූත්‍රයක්........... කැමතිද අහන්න, එහෙමයි හාමුදුරුවනේ........... එහෙනම් හොඳට අහගන්න ඕනෙ.........

**(ලබන කලාපයට)**